JMC vLearning
"your virtual learning partner"

# ව්‍යවසායකත්වය

අනුෂාල් ලියනගේ


ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

ඔබ මොහොතකට ඔබගේ දෙඇස් පියා ඔබගේ පරිසරයේ ස්වාභාවික නොවන දෑ පිළිබඳ මතකයට ගන්න උත්සාහ කරන්න.


ගහ කොළ, පරිසරය, වන සතුන් ගංගා, ඇළ දොල ---------------- යනාදී සියළු දේ ස්වාභාවිකවම අපට ලැබී ඇත. එහෙත් එම ස්වාභාවික තත්ත්වයන් ඉක්මවා පුද්ගල ජන ජීවිතයට අවශය වන, එහෙත් ස්වාභාවයෙන් නොලද බොහෝ දෑ ද අපට මෙනෙහි කරගත හැකිය.

මේ අනුව ස්වාභාවයෙන්ම ලද දෑ වලට අමතරව මිනිසා විසින් බොහෝ දෑ නිපදවා ඇති බව අපට පසක් කර ගත හැකිය. සත්‍ය වශයෙන්ම එහි අවශ්‍යතාවය කුමක්ද?

ව්‍යවසායකත්වය සහිත හැඳින්වීම සඳහා බොහො නිර්වචන යොදා ගත හැකිය. එහෙත් එහි මූලික සංකල්පය හෝ හරය වන්නේ ,පවතින තත්ත්වයන් වෙනස් කිරීම, යන්නයි. කිසියම් රටක, සමාජයක, ආර්ථික තත්තවයක හෝ සංස්කෘතියක පවතින මූලික තත්ත්වයන් වෙනස් කොට නව අර්ථ කථන සපයනු ලබන්නේ ව්‍යාවසායකත්වය මඟිනි.

ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ නිරත වන පාර්ශවය ව්‍යවසායකයා ලෙස හැඳින්වෙන අතර එහි තවත් මූලික අදහසක් වන්නේ අවස්ථාවෙන් හඹා යාම, නව භාණ්ඩ, සේවා නිපදව වීම තුලින් නව ව්‍යාපාරික අවස්ථා ගොඩ නැගීම යන්නයි. තවත් ආකාරයකට සැලකුවහොත්, කිසියම් රටක් තුල පවතින සීමිත සම්පත් සඳහා වටිනාකමක් හො අගයක් නිර්මාණය කරනු ලබන්නේ ව්‍යවසායකයෙකු විසින. එනම් සීමිත සම්පත් / නිෂ්පාදන සාධක යොදා ගනිමින් නව නිර්මාණ කරනුයේ යෙදෙන්නා ව්‍යවසායකයාය.

ව්‍යවසායකත්වය බිහිවීම හෝ එහි ඇරඹුම යන්න පැහැදිලි කිරීම සඳහා පහත ක්‍රියාවලිය පැහැදිලි කරමු.




ඉහත ක්‍රියාවලිය සලකා බැලීමේදී නව ව්‍යාපාරයක් හෝ නව්‍ය නිෂ්පාදිතයක් බිහිවීමට සම්පූර්ණයෙන්ම ඉවහල් වන්නේ ව්‍යවසායකත්වයයි.

## නිර්වචනයන්

- "නව භාණ්ඩ හෝ සේවා හඳුන්වා දීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් හෝ නව අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් හෝ පවතින අර්ථ ක්‍රමය වෙනස් කිරීමේ ක්‍රියාවලිය ව්‍යාවසායකත්වයයි".

- ජෝසප් ෂුම් පීටර් -

- "ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම ව්‍යවසායකත්වයයි".

- ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය -


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- "අවිනිශ්චිතතා සඳහා මුහුණ දීම ව්‍යවසායකත්වයයි".

- රිචර්ඩ් කැන්ටිනම් -

- "නව ව්‍යාපාරයක් දියත් කොට සාර්ථකව පත්වා ගෙන යාමට ඇති හැකියාව ව්‍යවසායකත්වයයි".

- අන්තර් ජාතික කම්කරු සංවිධානය -

- "අවස්ථාවක් උදා කරගෙන ඉන් ප්‍රයෝජනයට ගැනීමට සංවිධානයක් නිර්මාණය කරන්නා ව්‍යාවසායකයෙකි".

- විලියම් ඩී බයිග්‍රේම් -

## ව්‍යවසායකයා

ව්‍යාවසායකත්ව ක්‍රියාවලිය තුල සක්‍රීයව යෙදෙන පාර්ශවය ව්‍යාවසායකයාය. ඒ සඳහා පහත නිර්වචනයන් සලකා බලනු ලබයි.

- "නව සංවිධානයක් නිර්මාණය කරන පුද්ගලයාය".

- වෙස්පර් -

- "නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් හෝ නව අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් හෝ පවත්නා අර්ථ ක්‍රමය වෙනස් කරන පුද්ගලයා ව්‍යවසායකයාය".

- ජෝශප් පීටර් -

- "වැටුපට වැඩ නොකරන ස්වයං සේවා නියුක්තියකි".

- රිචර්ඩ් කැන්ටිනම් -

## ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර සම්බන්ධතාවය

ඉහත සඳහන් කළ ආකාරයට ව්‍යවසායකත්වය මත පදනම්ව නව ව්‍යාපාර සංවිධාන බිහිවෙයි. ව්‍යාපාර විසින් මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරනු ලබයි. එසේ කරනු ලබන්නේ භාණ්ඩ හා සේවා නිපදවා ඒවා සමාජය හා හුවමාරු කිරීම තුලිනි. භාණ්ඩ හා සේවා නිපදවීමට නම් සම්පත් භාවිතා කළ යුතුය.

මේ අනුව සීමිත සම්පත්/නිෂ්පාදන සාධක සඳහා වටිනාමක් නිර්මාණය කරනු ලබන්නේ ව්‍යවසායකත්වය විසිනි. මේ අනුව ව්‍යවසායකත්වය යනු,

- පවතින තත්ත්වයන් වෙනස් කරන පුද්ගලයන්ය
- නව ව්‍යාපාර නිර්මාණය කරන්නන්ය
- ගවේශකයන්ය
- නව භාණ්ඩ හා සේවා ඉදිරිපත් කරන්නන්ය
- පරිසරය හා බැදි අවස්ථා හඹා යන්නෝය.
- සීමිත සම්පත් සඳහා වටිනාකම් ලබා දෙන්නෝය.
- අවදානම් කළමනාකරණය කරන්නෝය.

JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## ව්‍යවසායකත්ව ලක්‍ෂණ

ව්‍යවසායකයන් යනු බිහිවිය යුත්තන් වන නමුත් නිර්මාණය කළ හැකි අය නොවේ. ඔවුන්ගේ දැකිය හැකි සුවිශේෂ ලක්‍ෂණ කිහිපයක් පහත දැක්වේ.

### (1) දැක්ම (Vision)

තමා විසින් අනාගතයේදී කුමන තත්ත්වයකට පත්වන්නේද යන්න පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහිතව ක්‍රියා කරයි.

### (2) නව ව්‍යාපාරයක අවස්ථා හඳුනා ගැනීමේ හැකියාව

සමාජයක පවතින ගැටළු තුලින් ව්‍යාපාර අවස්ථා ජනිත කර ගැනීමට ඇති හැකියාව මින් අදහස් කරයි.

### (3) ආත්ම විශ්වාසය (Self Confidence)

අරමුණු සාර්ථක කර ගත හැකිය යන්න කෙරෙහි ව්‍යවසායකයා විශ්වාසය තබන්නේ ඔහු කෙරෙහිය.

### (4) නිර්මාණශීලීභාවය හා නවෝත්පාදන

යම් නව අදහසක් ඉදිරිපත් කිරීම නිර්මාණශීලීත්වය වන අතර එම අදහස ක්‍රියාත්මක කොට නව නිපැයුමක් ඉදිරිපත් කිරීම නවෝත්පාදනයයි.

### (5) තීරණ ගැනීමේ හැකියාව

ව්‍යාපාරික අවස්ථා මතුකර ගත් පසු එය ක්‍රියාත්මක කිරීම සඳහා තීරණ වලට එළැඹි හැකියාව මින් අදහස් කරයි. මෙහිදී ඉක්මන් හා නිවැරදි තීරණ ගත යුතුය.

### (6) ආභිප්‍රේරණතාවය

ආභිප්‍රේරණතාවය යනු කිසියම් පුද්ගලයෙක් තම කැමැත්තෙන් හා සතුටින් යම් ඉලක්කයක් සපුරා ගැනීමට ක්‍රියා කිරීමයි. මේ අනුව ව්‍යාවසායකයා නිරන්තරයෙන්ම ආභිප්‍රේරණය වූ පුද්ගලයෙකි.

### (7) කැපවීම

තම අරමුණ ඉටුවන තෙක් ඒ සඳහා කැප වී ක්‍රියා කිරීම ව්‍යාවසායකයන් සතු තවත් ගුණාංගයකි. ඒ සඳහා තම පෞද්ගලික ජීවිතයද ඔහු කැප කරනු ලබයි.

### (8) ස්වාධීන බව

ව්‍යවසායකයා සෑම විටම නිදහස අගය කරනු ලබන අතර නිදහසේ තීරණ ගනු ලබයි. ඔහු කිසියම් පුද්ගලයකු මත යැපෙන පුද්ගලයෙක් නොවේ.

### (9) සුභවාදී බව (Optimistic)

ව්‍යවසායකයා සෑම විටම ධනාත්මක සිතුවිලි සහිතව ක්‍රියා කරයි. ඔහු කිසිවිටක ඍණ අදහස් තම තීරණ වලට එක් නොකර ගනී.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

**(10)නම්‍යශීලීබාවය**

වෙනස් වන පරිසර තත්ත්වයන්ට අනුකූලව ඔහු තම චර්යාව වෙනස් කරන අතර ඒ සඳහා සාර්ථක ලෙස ප්‍රතිචාර දක්වයි.

**(11) ආභිලාශ මුදුන් පමුණුවා ගැනීමේ හැකියාව**

කිසියම් ඉලක්කයක් පිහිටුවා ගත් පසු එය කෙසේ හෝ අත්පත් කර ගැනීම මෙහි අදහසයි.

ඉහත ගුණාංගයන්ට අමතරව නායකත්වය, කළමනාරණ ගුණාංග, දැරීතම් හැකියාව, ස්වයං අවබෝධය වැනි ගුණාංගද ව්‍යාවසායකයා තුලින් දැකිය හැකිය.

**ව්‍යවසායකත්ව කුසලතා**

ව්‍යවසායකයා තුලින් හඳුනාගත හැකි කුසලතා කිහිපයකි.

**(1) නායකත්ව කුසලතා**

ව්‍යවසායකයාට නායකයෙක් නැත. ඔහුගේ නායකයා ඔහුමය. එහෙත් ඔහු විසින් ව්‍යාපාරයේ සෙසු පාර්ශවයන් හෙවත් අනුගාමිකයින් ව්‍යාපාර අරමුනු කරා මෙහෙයවනු ලබයි.

**(2) අන්තර් පුද්ගල සබඳතා**

විවිධ පාර්ශවයන් සමඟ සාකච්ඡා කරමින් වඩා ශක්තිමත් සම්බන්ධතාවයක් පවත්වා ගැනීමේ හැකියාව මින් අදහස් කරයි.

**(3) සන්නිවේදන කුසලතා**

තමාට අවශ්‍ය වන තොරතුරු ලබා ගැනීමෙන් හා ඒවා අබබෝධ කර ගනිමින් මෙන්ම අවශ්‍ය පාර්ශව වෙත තොරතුරු බෙදා හැරීමට ඇති හැකියාව සන්නිවේදන කුසලතාවයි.

**(4) මූලික කළමනාකරණ කුසලතා**

එනම් ව්‍යාපාරයක් සතු සම්පත් සැලසුම් කිරීම සංවිධානය කිරීම, නායකත්වය හා පාලන යන ශ්‍රිතයන් සම්බන්ධ මූලික දැක්ම.

**ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා**

මෙම භූමිකා 02 හි වෙනස වටහා ගත යුතුය. ඕනෑම ව්‍යවසායකයෙකු ව්‍යාපාරයෙන් වුවද ඕනෑම ව්‍යාපාරිකයෙක් ව්‍යවසායකයෙක් නොවේ. එබැවින් පහත දැක්වෙන වෙනස්කම් ඒ සඳහා යොදාගත හැකිය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | ව්‍යවසායකයා | | ව්‍යාපාරිකයා |
|---|---|---|---|
| 1. | නව සංකල්ප අනුව ව්‍යාපාර ආරම්භ කිරීම. | 1. | පවතින අදහසක් අනුව ව්‍යාපාර ආරම්භ කරයි. |
| 2. | ව්‍යාපාරික තරඟකරුවා ව්‍යවසායකයාමය. | 2. | අනෙකුත් ව්‍යාපාර ප්‍රතිවාදීන් වේ. |
| 3. | නවෝත්පාදකයෙකි. | 3. | සම්ප්‍රදායකයෙකි. |
| 4. | අවදානමට මුහුණ දෙයි. | 4. | ආරක්ෂාකාරීව ක්‍රියා කරයි. |
| 5. | ව්‍යාපාර අවස්ථා කෙරෙහි අවධානය යොමු කරයි. | 5. | ව්‍යාපාර කටයුතු කරයි. |

### ව්‍යවසායකයා හා කළමනාකරුවා

ව්‍යවසායකයා හා කළමනාකරුවා යනු සැලකිය යුතු මට්ටමින් විශ්ලේෂණය කළ යුතු මාතෘකාවකි.

මෙම වෙනස වටහා ගැනීමට පහත දැක්වෙන සටහන යොදා ගත හැකිය. මූලික වශයෙන් ව්‍යවසායකයෙකු ව්‍යාපාරයක් ආරම්භ කරන අතර එය පවත්වා ගෙන යනු ලබන්නේ කළමනාකරුවා විසිනි.

| | ව්‍යවසායකයා | | කළමනාකරු |
|---|---|---|---|
| 1. | ව්‍යාපාරයක ආරම්භකයාය. | 1. | ඇරඹූ ව්‍යාපාරය පවත්වා ගෙන යන පුද්ගලයාය. |
| 2. | ලාභය හෝ පාඩුව ප්‍රතිලාභය වන අතර ඒ සඳහා අවදානම් දරයි. | 2. | වැටුප මූලික ප්‍රතිලාභය වන අතර ඒ සඳහා කළමනාකරණ හැකියාව යොදවයි. |
| 3. | පරිසරය විශ්ලේෂණය කොට ව්‍යාපාරික අවස්ථා හඳුනා ගනී. | 3. | ව්‍යාපාරික ගැටළු හඳුනා ගනී. |
| 4. | බලය තමා විසින් නිර්මාණය කර ගනී. | 4. | අධිකාරී බලයක් කළමනාකරුගේ තනතුර සමඟ ලැබේ. |
| 5. | ප්‍රතිලාභය අසීමිතව ලැබිය හැකිය. | 5. | ප්‍රතිලාභය සීමිත තත්ත්වයකි. |

### ව්‍යවසායකත්ව ක්‍රියාවලිය

දැනට සාකච්ඡා කොට ඇති කරුණු වලින් පැහැදිලි වන්නේ ව්‍යවසායකත්වය කිසියම් රටකට හෝ සමාජයට කොතරම් වැදගත්ද යන්නයි. මේ අනුව ව්‍යවසායකත්ව ක්‍රියාවලියක් මේ හරහා ගොඩ නැඟිය හැකිය.

1. **නව්‍යතා සොයා ගැනීම (Discovery)**

   එනම් පරිසරය අධ්‍යයන කිරීම තුලින් නව ව්‍යාපාරික අවස්ථා හැදුනා. ඊට සරිලන නව අදහස් (භාණ්ඩයක් / සේවාවක්) පිළිබඳ අදහසක් ඇති කර ගැනීමයි.

2. **සංකල්ප ගොඩනැඟීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම**

   මූලික ව්‍යාපාර සැලැස්මක් ගොඩ නැඟිය යුතු අතර ඉන් ව්‍යාපාරයේ ගමන් මඟ පැහැදිලි කල හැකිය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### 3. සම්පත් සම්පාදනය

සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් සම්පාදනය කර ගැනීම මෙම පියවරේදී සිදු වේ. (නිෂ්පාදන සාධක)

### 4. යථාර්තයක් බවට පත් කිරීම

එනම් පරිසරය අධ්‍යයන කිරීම තුලින් නව ව්‍යාපාරික අවස්ථා හැදුනා. ඊට සරිලන නව අදහස් (භාණ්ඩයක් / සේවාවක්) පිළිබඳ අදහසක් ඇති කර ගැනීමයි.

### 5. ප්‍රතිලාභ ලැබීම

ව්‍යාපාරයේ අනාගත සංවර්ධනය පිළිබඳ තීරණ මෙහිදී ගනු ලබන අතර ව්‍යවසායකයා ලාභ/අලාභ ලබයි.

## ව්‍යවසායකත්වයේ නව ප්‍රවණතා

ඕනෑම ක්ෂේත්‍රයක වෙනස් වීම් දැකිය හැකිය. මේවා ප්‍රවණතා ලෙස හඳුන්වනු ලබයි. එවැනි ප්‍රවනතා කිහිපයක් පහත දැක්වේ.

### 1. අභ්‍යන්තර ව්‍යවසායකත්වය

එනම් ව්‍යාපාරයන්හි අභ්‍යන්තර සේවකයන්ගේ නිර්මාණශීලී අදහස් ලබාගෙන එය ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ගැනීම මින් අදහසයි. මේ සඳහා අභ්‍යන්තර සේවකයන් ආභිප්‍රේරණය කළ යුතුය.

### 2. සමාජයීය ව්‍යවසායකත්වය

සාමාජීය ලෙස මෙහෙවරක් කිරීමේ චේතනාවෙන් සමාජීය ගැටළු වලට පිළියම් යෙදීමට නවෝත්පාදනයේ යෙදීම මෙහි අදහසයි. මානසික තෘප්තිය, පිළිගැනීම, ප්‍රශංසාව වැනි සමාජීය ප්‍රතිලාභ මෙම ව්‍යවසායක තත්ත්වය තුලින් අපේක්ෂා කරයි.

### 3. හරිත ව්‍යවසායකත්වය

මෙම ව්‍යවසායකත්වය තුලින් අපේක්ෂා කරනු ලබන්නේ පාරිසරික හෝ සමාජීය ගැටළු අවශ්‍යතා සඳහා ඉහල දායකත්වයක් ලබා දීමයි. පරිසරය සුරැකීම හරිත ව්‍යවසායකයින්ගේ හර සංකල්පය බවට පත් වී ඇත.

### 4. ගෝලීය ව්‍යවසායකත්වය

වර්තමානයේ දිනෙන් දිනට වර්ධනය වන නවීන තාක්ෂණික පහසුකම් උපයෝගී කර ගනිමින්, ව්‍යාපාර සංවිධාන තම නිෂ්පාදන මුළු ලෝකයටම ලබා දෙමින් ව්‍යාපාර කටයුතුවල යෙදීම මෙහි අදහසයි. ලෝකයේ ඕනෑම ස්ථානයක සිටින පාරිභෝගිකයෙකු වෙතොත්, එම රටට සංස්කෘතියට ගැලපෙන පරිදි නිස්පාදිත ඉදිරිපත් කිරීම මෙම නව ව්‍යවසායකත්වයයි.

### 5. කාන්තා ව්‍යවසායකත්වය

බොහෝ කාන්තාවන් වර්තමානය වන විට ව්‍යවසායකත්ව කටයුතු සඳහා යෙදීම ප්‍රවනතාවයකි. ඊට බලපෑ හේතු කිහිපයකි.

1. පවුලේ ආදායම් තත්ත්වය ඉහල නැංවීම.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

2. කාන්තාවන් තුල ඉහල අධ්‍යාපනයක් වර්ධනයව වීම.
3. සාමාජීය ආකල්පවල වෙනස්කම් ඇති වීම.

එසේම මේ සඳහා බලපානු ලබන ගැටළු කිහිපයකි.

1. ඇතැම් රටවල පවතින නීති රීති
2. නිවසේ කටයුතුවල නිරත වීමට සිදු වීම
3. ආගම් හා සංස්කෘතික කටයුතු වල බලපෑම

## ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ

ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ කොටස් කීපයක් යටතේ සාකච්ඡා කල හැකිය.

### 1. පුද්ගල ප්‍රතිලාභ

i. ව්‍යවසායකයා තමාගේ ප්‍රධානියා බවට පත්වීම.
ii. පුද්ගල හැකියාවෙන් ප්‍රයෝජන ගත හැකි හැකි වීම.
iii. ඉහල සාමාජීය පිළිගැනීමක් ඇති වීම.
iv. නිදහස් තීරණ ගැනීමේ හැකියාව.
v. ප්‍රතිලාභ ලැබීමේ සීමාවක් නොමැති වීම.
vi. ඉහල ජීවන මට්ටමක් ලැබිය හැකි වීම.

### 2. ආයතන ප්‍රතිලාභ

i. ව්‍යාපාර කටයුතු පුළුල් කර ගත හැකි වීම.
ii. වෙළඳපොල කොටස් වර්ධනය කර ගත හැකි වීම.
iii. තරඟකාරීත්වයට පහසුවෙන් මුහුණ දිය හැකි වීම.
iv. ලාභදායීත්වය ඉහළ යාම.
v. වෙළඳපොල නායකත්වයට පත්විය හැකි වීම.

### 3. ව්‍යවසායකත්වයේ සාමාජීය හා ආර්ථික ප්‍රතිලාභ

i. නව රැකියා අවස්ථා ජනනය වීම.
ii. නව නිෂ්පාදන භුක්ති විදීමට සමාජයට අවස්ථාවක් ලැබීම.
iii. නව ආදායම් අවස්ථා උදාවීම.
iv. දේශීය සම්පත් භාජනයට ඉඩ ලැබීම.
v. ජනතා ජීවන මට්ටම ඉහල යාම.
vi. ජාතික නිෂ්පාදනය ඉහල යාම.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය

රටක ආර්ථික සංවර්ධනයේ මූලික පදනම ව්‍යවසායකත්ව සංවර්ධනයයි. ආර්ථිකය, සංවර්ධනය වීමට නම් එහි නොයෙකුත් අංශයන් ප්‍රසාරණය විය යුතුය. මේ අනුව මෙම සම්බන්ධතාවය පහත කරුණු මත අවබෝධ කරගත හැකිය.

i. වෙළඳපොල තුල තරඟකාරීත්වයක් ඇති වීම හේතුවෙන් භාණ්ඩ මිල අඩු කරගත හැකි වීම.

ii. පූර්ණ සම්පත් උපයෝජනයක් සිදු වීම.

iii. රැකියා ගැටළු වලට විසඳුමක් ලැබීම.

iv. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දියුණු වීමට උපකාරී වීම.

v. ශ්‍රම සූක්ෂම නිෂ්පාදන අවස්ථා බිහි වීම.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd